# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2255/56 - 2021 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා - 2021.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 03**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2015 සැප්තැම්බර් මස 01 වැනි දිනැති අංක 1930/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්.ඒ.බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින.

I කොටස

සංශෝධන අංක 01 - 2016 නොවැම්බර් මස 29 වැනි දින හා අංක 1995/10 *අති විශෙෂ ගැසට් පත්‍රය.*

සංශෝධන අංක 02 - 2018 ජුනි මස 25 වැනි දින හා අංක 2077/13 *අති විශෙෂ ගැසට් පත්‍රය.*

II කොටස

**7.2.5 බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් ප්‍රමාණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා

කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලබන අතර සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව බඳවාගනු ලැබේ.

7.3.3 වෙනත්

(II) නියමිත දිනට රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

(IV) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(I) සහ (III) වගන්ති නොවෙනස්ව පවතී.

**7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් ප්‍රමාණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලබන අතර සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව බඳවාගනු ලැබේ.

10.1.1.1 (IV) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.2.1.1 (II) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.3.2.1 (II) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.3.3.1 (II) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

12 - 219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.